පන්හිඳයි පින්සලයි



සිසිර දිසානායක

# පහළොවට ස්තුතියි

"සතියෙන් සතිය, මාසෙන් මාසේ ගෙවෙනවා. දන්නෙම නැතිව අවුරුදු පහළොවකුත් ගෙවිලා ගිහින්." පන්හිඳ තමන්ගේ පරණ ගමන් බලපත්තරේ පෙරළුවා. ලංකාවේදී ගත්ත ඒ බලපත්තරේ තවම පං ළඟ පරිස්සමට තියෙනවා.

පන්හිඳයි, පින්සල්යි මෙල්බන් ගුවන්තොටට ගොඩබැස්ස වෙලාවේ මුලින්ම පිළිග න්න ආව යාළුවෝ දෙන්නව මතක් වුණා පින්සලට.

"අපේ ගෙදර දොරේ ජීවිතේ මේ පත්තර ජීවිතේට වඩා විනාඩි පහළොවක් විතර බාලයි එහෙම බලනකොට." පින් කිව්වා.

නිමල් එක්ක ජගත් ඇවිත් පහන පත්තරේට ලියන්න කියලා කතා කරපු හින්දා වෙන්නැති පින් එහෙම කිව්වේ" පන් තමුන්ගේ සැකය දුරුකරගන්න වගේ ඇහුවා. නිමල් අබේසේකරයි, ජගත් ජේ. එදිරිසිංහයි මේ දෙන්නා ලංකාවේ පරණ යාළුවෝ.

පහත පත්තරේට "සම වැදුම" ලිපිය ලියන කාලේ ජගත් විතරක් නෙවී, වරුණ සාවින්ද මිත්‍රයත් නිතර මූණගැහුණා.

"ඒ දවස්වල යාළුවෝ මුණග ස්සවන්න, අළුත් යාළුවන්ව අඳුන්වලා දෙන්න ජගතුයි, නිමලුයි අපිව අරගෙන ගියේ අතින් පෙට්‍රල් ගහගෙන. කොහෙද ඉතිං ආව ගමං වාහනයක්වත් තිබුණායැ?" පන් ඒ අතීතයට හැරුණා.

වරුණලාගේ ගෙදර ගියාම "පහනට" ම දවස ගතයි, සෙව්වන්දිකා හදලා දුන්න පරිප්පුයි, සම්බෝලයි එක්ක රෝස පාන් කාලා පත්තරේ වෙනුවෙන් ගෙවුණ ඒ දවස් අමතක කරන්න බෑ. ඒ වාගේම තමයි. ජගත්ලාගේ ගෙදර ගියමත්. ශ්‍රීපාලිගේ සංග්‍රහත් අමතක කරන්න බෑ." පින් එකතු වුණා පන්ට.

"ඒ අයගේ දූලා පුතාලාත් අපි එක්ක හරි හරියට යාළු වුණා."


"අමතක කරන්න බැරි පන්ති මිත්‍රයෝ දෙන්නෙකුත් ඉන්නවානේ. රස්සාවක් ලැබෙනකල් ම හිත හයිය කරලා දුන්නේ රන්ජන්." පං මේ මතක් කරන්නේ රන්ජන් පහළවත්ත මිත්‍රයා ගැන. අනික් පන්ති මිත්‍රයා තමයි මහේන්ද්‍ර." පින් එකතු කළා මහේන්ද්‍ර කාලිංගමුදලිගේ නමත්.
"රස්සාවට "රෙෆරන්ස් " දුන්න සුමිත් ලියග නගේ මහත්තයයි තොරතුරු හොයලා දුන්න අතුල ප්‍රනාන්දු මහත්තයයි දෙන්නාවත් මතක් කරන්න ඕන."

"ඔය අතරට එකතු වුණා අසල්වැසියෙක් විදියට රෝහණවත්. මතකද? ජගත් තමයි රෝහණව අඳුන්නලා දුන්නේ." ඔය කතා වෙන්නේ රෝහණ කරුණාරත්නයි අනෝජායි ගැන. උපා උපදස ස්වර්ණ උපදස දෙන්නත් ඒ කාලේ තමයි පන්ලට අඳුනාගන්න ලැබුණේ. එක අතකින් ඒ වැඩිහිටියෝ විදියට. ප්‍රියන්ත ප්‍රනාන්දුත් එක් වුණා ඔය අතරට.

"ඇයි ප්‍රේමා අක්කයි, ධම්මි අයියයි දෙන්නා? කටුගම්පොල දෙන්නත් ඉතින් වැඩිහිටියෝ තමයි."

පන්හිඳයි, පින්සලයි මෙහෙ ගෙන්නා ගන්න උනන්දු වෙලා ඉඳුම් හිටුම් දීලා උපකාර කළේ සැම්සන් ඒකානායකයි, රංජනි ඒකනායකයි දේපළ. ඒ අයගේ හිතවතුන් දරුවන් පවා මේ දෙන්නට ලොකු සහනයක් වුණා ඇත්තටම.

"පහන බන්දු අයියා අතට ගියාමත් අපට දිගටම අඳින්න, ලියන්න ලැබුණ එකක් මතක් කරන්න ඕන. අද වෙනකලුත් මිහිරි අපි එක්ක එක විදියටම වැඩ කරන එක ලොකු දෙයක්." බන්දු දිසානායක, මිහිරි දිසානායක දෙපළ ගැන මතක් කරන්න පන් පින් අමතක කලේ නෑ. ටියුඩර් අමර සේන, ජයශ්‍රී චන්ද්‍රජිත් මහත්වරුත් ඔය කාලේ කතෘලා වෙලා හිටිය බව දෙන්නට මතකයි. මෙහේ වැඩවලට පන් පින් දෙන්නව දායක කරගත්ත මාලනී ජයසිංහ මහත්මිය දැන් අප අතර නෑ.



"අසෝක සුබසිංහයි, ජගතුයි දෙන්නා සන්නස පටන්ගත්තේ ඔන්න ඔය කාලේ. පන්ට මුලින්ම ලියන්නත් පින්ට මුලින්ම අඳින්නත් ජගත් කතා කළානේ. ඔය කාලේ තමයි මාත් මේ රටට ආවේ.

පැන්සලක් කතාවට එක් වුණා හරියට ම වෙලාවට. පැන්, පන් පින් දෙන්නා එක්ක චමරියෙ පදිංචියට ඇවිත් හවුල් වුණා මේ දේවල්වලට. විල්ෆ්‍රඩ් සිරිවර්ධන මහත්තයා "සිහනද" කියලා පත්තරයක් පටන් ගත්තාම පැන්ටත් ආරාධනයක් ලැබුණා ලියන්න. තමන් දන්නා සිවිල් ඉංජිනේරු සෑත්තරේ ගැන පැන් "දියකැට පහන" කියලා ලිපියක් ලියනවා තවමත්.

දෙරණ ආහාර පාන මේ රටට ගෙන්නවන ඩෙන්සිල් ජයවීර මහත්තයාව පන්ට මතක් වුණේ මේ ගීත රාචනා කලාවක් එක්ක.

"හීනෙකින්වත් හිතුවෙ නෑ සී.ඩී. එකක් කරන්න. ඩෙන්සිල් නිසා තමයි ඒ පිස්සුව හැදුණේ. පින් හෙමිහිට කියාගත්තා.
"නුඹේ සිරික්කියට" මුල් ම සංගත තැටියට විතරක් නෙවෙයි; "අතුරු මිතුරු" ළමා සංගත තැටියටත් අනුග්‍රහය ඩෙන්සිල් මහත්තයාගෙනුයි ලැබුණේ. ඊට පස්සෙයි "සිදංගනා", "සිනාවි" සංගත තැටි එළි දැක් වුණේ.

මේ සංගත තැටි එළිදැක්වුණ හැම ප්‍රසංගයකට ම එක එක විදියට උදව් උපකාර කරපු අය හරියට ඉන්නවා. සමරු කලාප බලාගෙන නම් මතක් කරන් පුළුවන්. ඒත් ඉතින් මේ වෙලාවේ ඒ ලැයිස්තු දිග වැඩියි. මොනවා වුණත් සංගීත වාදනයෙන් උදව්කරපු කැමරන් කොළඹගේ, නාලක වීරකෝන්, රෝහිත උඩවෙල වගේ ම අධ්‍යක්ෂණය කරපු තරුපති මුණසිංහ, ඉන්ද්‍රජිත් මිරිහාන දෙන්නව මතක් කරන්න ඕන. හැම වෙලේම නැටුම් නිර්මාණය කරලා දුන්න රසිකා කුලසිංහ මහත්මියත් රංගන උදුම්බරා දෙපළත්, අභින කණ්ඩායමත් ඔය එක්ක ම මතක් වෙනවා. හර්ෂ ජයලත් බණ්ඩාර, ගාමිණී රණසිංහ, ජගත් කොතලාවල කියන අය තමයි වේදිකාව පාලනය කළේ. අනුරුද්ධ විජේරත්න, ශ්‍රීනාත් මද්දුමගේ, නිම්නා රූපසිංහ, මධුර සෙනෙවිරත්න, නිමාෂිනි පැල්පොල වගේ අයත්, හසල ගෝවින්න, ඩිල්ෂාන් ෆර්නැන්ඩු චාමිකා ලියනගේ වගේ තරුණ අයත් මේ ප්‍රසංග ඉදිරිපත් කළා." දසුන් ගජමන්, සුජිත් බණ්ඩාර වගේ අයත් එකතු වුණා.

මේ හැම දෙයක්ම පස්සෙන් හිටිය මහෙන්ද්‍ර කාලිපගමුදලි, පද්මා දිසානායක, සරිනි, පියත්, නිහාරා සනත් කණ්ඩායමක් මතක් කරන්න ඕන." ඒ පින්සල .

"වික්ටර් ගී විමංසා" පොත ලියපු වේලා වේ අඩු පාඩු බලලා දුන්න ස්වර්ණකාන්ති රාජපක්ෂ මහත්මිය වගේම ප්‍රචාරක කටයුතු වලට උදව් කළ දිල්රුක්ෂි විජේසූරිය, විල්ෆ්‍රඩ් සිරිවර්ධන ජගත්. ජේ. එදිරිසිංහ යන අය කලේ ලොකු උදව්වක්. ඒ වගේ ම ඩඩ්ලි, ලලිතා දෙපළ රෝහිණී බස්නායක, බන්දු වේලාතන්ත්‍රි වගේ අයගේ උනන්දුවත් හරි වටිනවා. තමන්ගේ වැඩ වලට පන් පි න්ව දායක කරගන්න "කාවතා" "බ්‍රන්ස්වික්" සිංහල භාෂා පාසල අමතක කරන්න බෑ.

ඇයි අපි සින්දු කියන්න යන "ගී දැහැන", "මියුරුසර" වගේ කණ්ඩායම්? පැන් තව පැත්තකට හිත් හැරෙව්වා. සාමධි භක්ති ගීත කණ්ඩායම් කොලින් පල්ලියගුරු? නිරානි පතිරගේ තමයි භක්ති ගීත කියන්න අඩගැහුවේ.

නිමල් නන්ද ජයන්ත, චින්තක, කපිල, චානක, සුසිල්, ෂර්ලි, වසන්ත වාගේ අය සින්දු කණ්ඩායම්වල මුණගැහෙන උදවිය.

"අපිට මුලදී කීපදෙනෙක් මඟ හැරුණා නේද?" පින් ඇහුවා "පන්ව මුලින්ම 3''' රේඩියෝ එකට එක්ව ගිය ප්‍රසන්න කුරුකුලරත්න? ඇයි, තුම්මන්සල වෙබ් අඩවියට සම්බන්ධ කරගත්ත උදය ගෝවින්න? "ඔස් නිව්ස් ලංකා" කණ්ඩායමේ චන්දිම ජයනේත්ති? චැනල් 31 රූපවාහිනි යේ නිමල් සුගිතා දෙන්නා? "කැඩපත" පත්තරේ සාමන්ත තැන්නගේ? දසුන් ගජමන් ජානක බාලසූරිය? නුවන් සමරපති? පැතුම් තිලක්සිරි?

අපේ වැඩ කටයුතුවලදි උපදෙස් අනුශාසනා ලැබුණේ නාමදුන්නේ විජිත, අකරවිට සංඝානන්ද ස්වාමින් වහන්සේලාගෙන්නේ. සිංහල භාෂාවේ යමක් අහගන්න ඕන වුණානම් පර්තවල ඉන්න වි.ක ධර්මබන්ධු මහත්තයා තමයි ඉතින් අදටත්. අපිට මෙල්බන් වල මුල අමතක කරන්න බෑ. රස්සාවක් නැති කාලේ "වේවලි ස්පයිසස්" සිංහල වෙළඳ සැලේ ඉරිදට වැඩ කරපු එකෙක් අපේ කී දෙනෙක් මුණ ගැහුණද? කිත්සිරි, ප්‍රේමාවයි මතක් වෙනවා ඒ ගැන කියනකොට."

"ආදි ශිෂ්‍ය සංගමයට අපිව සම්බන්ධ කරපු රෝහිත රුක්මන් විමලසූරියව මුණගැහුනේ ඔය කඩේදී නේ. රවි, ගාමිණී කරවිදෙණිය දෙන්නාවන් මතක් කරන්න ඕන.

"මෙහෙම මේ නම් වට්ටෝරුවක් කියන්න හැදුවට කියලා ඉවරකරන්න බෑ වගෙ නේද? හැමදාමත් අපේ දේවල් අගය කරපු අයට ආරාධනා කරලා "සිසිර සරණිය" කියලා උත්සවයක් පවත්වපු හෙළ මාත්‍රා කණ්ඩායමේ මධු නානයක්කාර මහත්මිය මතක් කරන්නේ අර හැම දෙනාම වෙනුවෙන්. අපිව අගය කරන, අඩුපාඩු පෙ න්නලා දෙන, අපිව තමන්ගේ දේවල් වලට දායක කරගන්න අය නිසා නොදැනිම අවුරුදු පහළොවක් මෙල්බන් වල ගෙවුණා.

"ලංකාවේ පිටවෙලා ආවේ හරිම දුකෙන් නෑ හිත මිත්‍රයෝ කැමති දේවල්, පුරුදු පරිසරය දාලා ඒ ආව ගමනේදී හිතට ඇතිවුණ සංකාව, වෙහෙස නිවලා දුන්න හැමෝට ම තුති හිතින් ම ස්තුතිවන්ත වෙනවා.